# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,074 - 2018 ජුනි මස 01 වැනි සිකුරාදා - 2018.06.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු ... ... ... | 990 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බදුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1001 |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1010 |


සැ. යු. - (i) බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 2018 මැයි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 2018 මැයි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ජුනි මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජුනි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## තනතුරු - ඇබෑර්තු

### අගලවත්ත ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ අගලවත්ත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු | 02 | PL1 – 2016<br>රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | 8 ශ්‍රේණිය ( 9 වසර) සමත් වී තිබිය යුතුය. |

02. *කායික සුදුසුකම් :*

තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

03. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(iii) යහපත් චරිතයකින් යුක්ත හා මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.

(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

(v) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

04. *වයස* .- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* .- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙළ මත බඳවා ගැනීම සිදු කෙරේ.

06. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත 2018.06.14 හෝ එදිනට පෙර "ලේකම්, අගලවත්ත ප්‍රාදේශීය සභාව, අගලවත්ත" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ii) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය.

(iii) අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

*(අ)* උප්පැන්න සහතිකය;
*(ආ)* අධ්‍යාපන සහතික;
*(ඇ)* පාසලෙන් අස්වීමේ සහතිකය;
*(ඈ)* පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය.);
*(ඉ)* මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක්.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල අගලවත්ත ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ලලනි දීපිකා උඩුමුල්ල,
ලේකම්,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2018 මැයි මස 05 වැනි දින.

**. ආදර්ශ අයදුම්පත්‍රය**

***අගලවත්ත ප්‍රදේශීය සභාව***

*අගලවත්ත ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :——————————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————.
03. ස්ථිර ලිපිනය :——————————————.
04. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :——————————————.
05. දිස්ත්‍රික්කය :——————————————.
06. උපන් දිනය : අවුරුද්ද: —————. මාසය: —————. දිනය: —————.
07. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට (2018.06.14) වයස :අවුරුදු: —————. මාස: —————. දින: —————.
08. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————.
09. විවාහක/අවිවාහක බව :——————————————.
10. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————————.
11. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.
12. දුරකතන අංකය :——————————————.
13. අධ්‍යාපන සුදුසුකම් :——————————————.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

..............................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

06-07

---

**මහරගම නගර සභාව**

මහරගම නගර සභාවේ පුරප්පාඩුව පවතින බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම් කිරීමට සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාතේ පදිංචි පුරවැසියන් වෙතින් අයදුම්පත් 2018.06.20 වන දින දක්වා භාර ගනු ලැබේ.

අයදුම්පත් ලේකම්, මහරගම නගර සභාව, මහරගම'' යන ලිපිනයට 2018.06.20 වන දින දහවල් 12.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස උඩු කෙළවරේ තනතුරු නාමය සඳහන් කළ යුතු අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

01. තනතුර හා වැටුප් පරිමාණය :

| | | |
|---|---|---|
| රියදුරු | - 04 | රු.25,790 - 10 x 270- 10 x 300 - 10 x 330 - 12 x 350 - රු.38,990 |
| ආයුර්වේද ඖෂධ සංයෝජක | - 02 | රු.25,250 - 10 x 270 - 10 x 300 -10 x 330 - 12 x 350 -රු.38,450 |
| ආදාහනාගාර ක්‍රියාකරු | - 06 | රු.25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 -රු. 38,450 |
| මුරකරු | - 01 | රු.24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු.36,410 |
| සෞඛ්‍ය කම්කරු<br>වැඩ ක්ෂේත්‍ර කම්කරු | - 05<br>- 03 | රු.24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු.36,410<br>රා. ප. ච. 3/2016 (උපලේඛන II අනුව) |

02. බඳවා ගන්නා ශ්‍රේණිය — III ශ්‍රේණිය

03. අධ්‍යාපන සුදුසුකම් :

| | |
|---|---|
| රියදුරු | අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන 02 සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම (මින් විෂයයන් 05 ක් එකවර සමත් විය යුතුය.) |
| ආයුර්වේද ඖෂධ සංයෝජක | අ.පො.ස. (සා. පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 සමත් වීම (මින් විෂයයන් 05 ක් එකවර සමත් විය යුතුය.) |
| ආදහනාගාර ක්‍රියාකරු | - එම - |
| මුරකරු | - එම - |
| සෞඛ්‍ය කම්කරු /වැඩ ක්ෂේත්‍ර කම්කරු | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්වී තිබිය යුතුය. |

04. වෘත්තීය සුදුසුකම් :

| | |
|---|---|
| ආයුර්වේද ඖෂධ සංයෝජක | අදළ නැත |
| ආදාහනාගාර ක්‍රියාකරු | අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවක් ලබා තිබීම. |
| රියදුරු | 1. භාර බර හොණ්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ පැදවීමේ රියදුරු බලපත්‍ර ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් A1 සහ C 1 පන්තියේ බලපත්‍රයක් හෝ නව බලපත්‍රය අනුව බී සහ ඩී 1 පන්තියේ බලපත්‍රය ලබා තිබීම.<br>2. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ දැනුම |

| | |
|---|---|
| මුරකරු | අදාළ නැත |
| සෞඛ්‍ය කම්කරු | අදාළ නැත |
| වැඩ ක්ෂේත්‍ර කම්කරු | අදාළ නැත |

05. පළපුරුද්ද :

| | |
|---|---|
| රියදුරු | බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය) |
| ආයුර්වේද ඖෂධ සංයෝජක | රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ රජය විසින් පිළිගත් ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක වසරකට නොඅඩු කාලයක ක්ෂේත්‍රයට අදාළ සේවා පළපුරුද්ද ලබා තිබීම. |
| | අවම වශයෙන් මාස 06 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. |
| ආදහනාගාර ක්‍රියාකරු | |

06. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය.

(ii) වැන්දඹු අනත්දරු හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා දායක විය යුතුය.
(ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ වලට යටත් විය යුතු වේ)

(iii) මෙම තනතුර වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.

07. වෙනත් සුදුසුකම් :

(i) ශ්‍රී ලාංකික පුරවැසියකු වීම.

(ii) සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(iii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(iv) යහපත් චරිතයකින් යුක්ත වීම.

(v) මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

(vi) රියදුරු තනතුර සඳහා
අවම උස අඩි 5 විය යුතුය. දිවා කාලයේ හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.
රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මඟින් ඒ බැව් සනාථ කළ යුතුය.

08. වයස් සීමාව : අයදුම්පත් කැඳවන දිනට අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතුය.

(09) බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය මඟින්,

(i) රියදුරු

වෘත්තීය පරීක්ෂණය :

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| i. රියපැදවීමේ නිපුණතාව | 40 | 20 |
| ii. මාර්ග නීති පිළිබඳ ප්‍රයෝගික දැනුම | 40 | 20 |
| iii. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |
| මුළු ලකුණු | 100 | |

(ii) ආයුර්වේද ඖෂධ සංයෝජක

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| විෂයයන් | උපරිම ලකුණු | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බඳවා ගැනීමට අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | 50% |
| දේශීය ඖෂධ පිළිබඳ ඇති අවබෝධය | 75 | |
| පෞර්ෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

(iii) ආදාහනාගාර ක්‍රියාකරු

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතර ලබා ඇති සුදුසුකම් | 20 | 50% |
| සාමාන්‍ය දැනුම | 75 | |
| පෞර්ෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

(iv) මුරකරු
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා ලබනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති සුදුසුකම් | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞර්ෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

සෞඛ්‍ය කම්කරු/වැඩ ක්ෂේත්‍ර කම්කරු
වුයුහගත සම්මුඛ පරීක්ෂණ

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 5 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞර්ෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

(10) ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද/මුදල් රෙගුලාසිවලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලටද, පළාත් පාලන ආයතනවලට අදාළ ආඥා පනත්වල විධිවිධාන වලටද, මහරගම නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝගවලටද අනුකූලව කටයුතු කළ යුතුය.

(11) මෙම තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ බඳවා ගැනීම හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල මහරගම නගර සභාවේ ලේකම් සතුය.

වී. ජී. විනීතා ඇපා,
ලේකම්. (වැ. බ.)

2018 මැයි 11 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල**

**....................... තනතුර සඳහා අයදුම් පත්‍රය**

01. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | |

02. මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්) :
.................................................................................................................................................
.................................................................................................................................................

03. මුලකුරුවලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | |

04. i. ස්ථිර ලිපිනය (සිංහලෙන්) :
.................................................................................................................................................
.................................................................................................................................................

ii. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | |

iii. තාවකාලික ලිපිනය (සිංහලෙන්) :
.................................................................................................................................................
.................................................................................................................................................

05. උපන් දිනය : අවුරුද්ද: [ ][ ][ ][ ] මාසය: [ ][ ] දිනය: [ ][ ]

06. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස: අවුරුදු: [ ][ ][ ][ ] මාසය: [ ][ ] දින: [ ][ ]

07. ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

(උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් ඇමිණිය යුතුය)

08. විවාහක/අවිවාහක බව : ................................................................

09. දුරකථන අංක : පෞද්ගලික : ........................................................

10. බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කාල සීමාව : .........................................................
(ග්‍රාම සේවා සහතිකය මගින් සනාථ කළ යුතුය.)

11. අධ්‍යාපන සුදුසුකම් :
.................................................................................................................................................
.................................................................................................................................................

(සුදුසුකම් සහතික කිරීමට අදාළ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

12. පළපුරුද්ද ෴

.....................................................................................................................................................................................

13. වෙනත් සුදුසුකම් (ක්‍රීඩා හා වෙනත්) ෴-

.....................................................................................................................................................................................

.....................................................................................................................................................................................

(සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සහතික කළ ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

14. i. ඔබ කිසියම් සාපරාධී වරදක් සම්බන්ධයෙන් කෙදිනකදී හෝ උසාවියකදී වරදකරු වී තිබේද? (ඔව්/නැත)
ii. ඔබගේ පිළිතුර ඔව් නම් වරදේ ස්වභාවය හා දඬුවම කුමක්ද?

.....................................................................................................................................................................................

.....................................................................................................................................................................................

ඉහතින් මා විසින් සඳහන් කරන ලද කරුණු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටින අතර, කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ............................................ III වන ශ්‍රේණියේ තනතුරකට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා........................................................ III වන ශ්‍රේණියේ තනතුරකට නුසුදුස්සු වන බවත්, පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියකින් තොරව සේවයෙන් පහ කළ හැකි බවත් මා දනිමි.

..................................................... ,
අයදුම්කරුගේ අත්සන.

දිනය ෴- ...........................................................

06-76

---

## මොරටුව මහා නගර සභාව

මොරටුව මහා නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01. | වැඩ ක්ෂේත්‍ර කම්කරු (III ශ්‍රේණිය) | 10 | PL1-2016 | රු.24,250 - 10 x 250 10 x 270 - 10 x 300 - 12 x 330 - රු.36,410 | 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත් වී තිබිය යුතුය. |
| 02. | සෞඛ්‍ය කම්කරු (III ශ්‍රේණිය) | 34 | PL1-2016 | රු.24,250 - 10 x 250 10 x 270 - 10 x 300 - 12 x 330 - රු.36,410 | 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත් වී තිබිය යුතුය. |
| 03. | කාර්යාල කාර්ය සහායක (III ශ්‍රේණිය) | 02 | PL1-2016 | රු.24,250 - 10 x 250 10 x 270 - 10 x 300 - 12 x 330 - රු.36,410 | අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය) |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 04. | මුරකරු (III ශ්‍රේණිය) | 01 | PL1-2016 | රු.24,250 - 10 x 250 10 x 270 - 10 x 300 - 12 x 330 - රු.36,410 | අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය) |
| 05. | සුසානභූමි භාරකරු (III ශ්‍රේණිය) | 01 | PL1-2016 | රු.24,250 - 10 x 250 10 x 270 - 10 x 300 - 12 x 330 - රු.36,410 | අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය) |
| 06. | ක්‍රීඩා භූමි භාරකරු (III ශ්‍රේණිය) | 01 | PL1-2016 | රු.24,250 - 10 x 250 10 x 270 - 10 x 300 - 12 x 330 - රු.36,410 | අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය) |
| 07. | පුස්තකාල සහායක (III ශ්‍රේණිය) | 01 | PL1-2016 | රු.24,250 - 10 x 250 10 x 270 - 10 x 300 - 12 x 330 - රු.36,410 | අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම. (එක්වරකදී විෂයයන් පහ (05) ක් අවම වශයෙන් සමත්ව තිබිය යුතුය) |
| 08. | රියදුරු (III ශ්‍රේණිය) | 07 | PL3-2016 | රු.25,790 - 10 x 270 10 x 300 - 10 x 330 - 12 x 350 - රු.38,990 | අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/ දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබීම. (එක්වරකදී විෂය-යන් පහ (05) ක් අවම වශයෙන් සමත්ව තිබිය යුතුය)<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br>(රියදුරු තනතුර සඳහා පමණයි)<br><br>II. පෞද්ගලික/කුලී රථ සහ තාරබර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍ර-වාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම (බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් "සී" සහ "සී 1" වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "බී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.<br><br>III. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | | IV. බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)<br><br>V. අවම උස අඩි පහක් (05) විය යුතුය.<br><br>VI. දිවා කාලයේ හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බව සනාථ කළ යුතුය. |

*බඳවා ගැනීමේ කොන්දේසි :*

(1) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.
(2) අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
(3) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවු 18 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතුය.
(4) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්වයකින් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
(5) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු හෝ දඬුවම් ලැබුවකු නොවිය යුතුය.
(6) තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන අවශ්‍ය සියලුම සුදුසුකම් 2018 අප්‍රේල් මස 30 වැනි දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.
(7) අදාල බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධාන අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් යොමු කරනු ලබන අතර, එහිදී ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.
(8) කිසියම් අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණයට කැඳවූ පමණින් හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි පමණින් එම අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස සලකනු නොලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත්විය යුතුවේ. තවද, ඔබ වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(2) බඳවා ගනු ලබන අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ.

(3) මෙම බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රජය හා බස්නාහිර පළාත් සභාව වරින් වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් කලින් කල පනවනු ලබන නියමයන්ට හා රෙගුලාසිවලට යටත්ව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

*අයදුම්පත් එවිය යුතු ආකාරය :*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතු අතර, අයදුම්පත් 2018.07.02 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මොරටුව, යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර අයදුම්පතේ සහ කවරයේ වම්පස ඉහල කෙළවරේ සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

2. තැපැලේදී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යවනු ලැබූ අයදුම්පත් හා මෙම දැන්වීමේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත්‍ර ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ඇත.

3. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය. එසේ එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
   - උප්පැන්න සහතිකය;
   - අධ්‍යාපන සහතික; (ප්‍රතිඵල සනාථ කිරීමේ සහතිකය ඇතුළුව)
   - ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය;
   - මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් ; (එක් සහතිකයක් ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් එකක් විය යුතුය.)
   - පොලිස් වාර්තාවක්.

4. යම් අයදුම්කරුවකු තනතුරු එකකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර පිළියෙල කර වෙන වෙනම කවරවල බහා ඉදිරිපත් කළ යුතුය.

ශාන්තා පී. ලියනගේ,
නාගරික කොමසාරිස්,
මොරටුව මහ නගර සභාව.

2018 මැයි මස 17 වැනි දින,
මොරටුව මහ නගර සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මොරටුව මහ නගර සභාවේ ............................. තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. මුලකුරු සමග නම :—————————————.
2. මුලකුරු වලින් හැඳින්වෙන නම :—————————————.
3. ස්ථිර ලිපිනය :—————————————.
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————————————.
5. ජාතික හැඳුනුම්පත් අංකය :——————.  දුරකථන අංකය :——————.
6. උපන් දිනය : අවුරුද්ද :————, මාසය :————, දිනය :————.
7. ජාතිය :—————————————.
8. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————, මාස :————, දින :————.
9. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
10. විවාහක/අවිවාහක බව :——————————.
11. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද?
12. අධ්‍යාපන සුදුසුකම් :——————————.
13. වෘත්තිය සුදුසුකම් හා පළපුරුද්ද :——————————.
14. වෙනත් සුදුසුකම් :——————————.
15. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම්, ඒ පිළිබඳ විස්තර
    I. දැනට දරන තනතුර :——————————.
    II. අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් ද යන වග?
    III. එම තනතුරට පත්වූ දිනය :——————————.
16. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද?

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බවද දනිමි.

............................................... ,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ............................

*දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම ඉල්ලුම්කරු/ කාරිය වන ....................................... මහතා/ මහත්මිය /මෙනවිය මෙම ආයතනයේ ...................................... ............ වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත්, ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

...................................................... ,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————.
තනතුර :——————————.
නිල මුද්‍රාව :——————————.

06-161

---

# පළාත් පාලන නිවේදන

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය ප්‍රකාරව දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් පහතින් සඳහන් කරනු ලබන උපලේඛනය හා එයට අදල පිඹුරුපත් අංක 1556, 1557 හා 1560 යටතේ සඳහන් කොට ඇති මංමාවත්, දික්වැල්ල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොදා ඇති මෙම මංමාවත් සම්බන්ධයෙන් අදළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය පළ වූ දින සිට මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් පහත සඳහන් මංමාවත් දික්වැල්ල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම පිණිස ප්‍රකාශ කරමි.

කිත්සර මුතුකුමාරණ
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව

2018 මැයි මස 04 වැනි දින,
දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු අංකය* | *සැලසුම් අංකය, මනින ලද දිනය හා මිනින්දෝරු මහතාගේ නම* | *මාර්ගයේ නම* | *මාර්ගයේ ආරම්භය* | *මාර්ගයේ අවසානය* |
|---|---|---|---|---|
| 01 | සැ : අ 1556<br>2017.12.19<br>එච්. කේ. අජිත් පුෂ්ප-කුමාර | සුහඳ මාවත | වේළුවනාරාම මාවත | දේවසිරි නාරායන ලලිත් ස්වර්ණශාන්ත මහතාගේ ඉඩම |
| 02 | සැ : අ 1557<br>2017.12.19<br>එච්. කේ. අජිත් පුෂ්ප-කුමාර | කපුකොරටුව පාර | ශ්‍රී චුල්ලපදුම මාවත | රංජිත් වත්තුහේවා මහතාගේ ඉඩම |
| 03 | සැ : අ 1560<br>2017.12.19<br>එච්. කේ. අජිත් පුෂ්පකුමාර | ඩැනියෙල් අබේවර්ධන මාවත | කිරිනැලිය රදම්පල මහා මාර්ගය | දයා ගමගේ මහතාගේ ඉඩම |


එච් . කේ . අජිත් පුෂ්ප කුමාර
ලියාපදිංචි මිනින්දෝරු සහ උසාවි කොමසාරිස්
අංක 63 / 9A , ශ්‍රී රතනපාල මාවත , මාතර .
ලි . ප . අ . 19861172
දුක 077- 3582470 , 071- 4083707

## දික්වැල්ල ප්‍රාදේශිය සභාව
### ඩැනියෙල් අබේවර්ධන මාවත

## පිඹුරු අංකය : 1 5 6 0

පරිමාණය . 1 : 1 0 0 0

ගම : රත්නාවල
ග්‍රා . නි . කොට්ඨාශය : රත්නාවල , කොට්ඨාශ අංක 455 C
ප්‍රා . ලේ . කොට්ඨාශය : දික්වැල්ල
ප්‍රා . සභාව : දික්වැල්ල
දිස්ත්‍රික්කය : මාතර
පළාත : දකුණු




යොමුව
ඉ : ඉවුර
සික : සිමෙන්ති කණුව
දුක : දුරකතන කණුව

| මායිම් පෙන්වා දුන්නේ / මායිම් බලා ගත්තේ | චාතිකා එදිරිවීර මිය , සංවර්ධන නිලධාරිනී , දික්වැල්ල ප්‍රාදේශිය සභාව. |
|---|---|

| කැබලි අංකය | බි මි ප්‍ර මා ණ ය | | | | මා ර ග යේ වි ස්ත ර ය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අ . | රූ . | පර් . | හෙක්ටයාර් | නම | ආරම්භය | අවසානය | වම් පස මායිම් | දකුණු පස මායිම් |
| A | 0 | 0 | 18.97 | 0.0480 | ඩැනියල් අබේවර්ධන මාවත | කිරිනැලිය රදම්පල මහාමාර්ගය | දයා ගමගේ මහතාගේ ඉඩම | ඒ.සී. අබේවර්ධන, අලවත්තගේ චන්ද්‍රසිරි , එච්.ඒ.වී. සෝමසිරි මහතුන්ගේ ඉඩම් | සණස සතු ඉඩම, වෙල්ලප්පුලි ආරච්චිගේ සුසන්ත, අලවත්තගේ චන්ද්‍රලතා, මාර්ගය සහ ඒ.සී. අබේසිංහ මහත්ම මහත්මීන්ගේ ඉඩම් |

මැනීම කළේ 2017 . 12 . 19 දින දිය

(අත්සන)

2018 . 01 . 10


එච් . කේ . අජිත් පුෂ්ප කුමාර
ලියාපදිංචි මිනින්දෝරු සහ උසාවි කොමසාරිස්
අංක 63 / 9A , ශ්‍රී රතනපාල මාවත , මාතර .
ලි . ප . අ . 19861172
දු . ක . 077- 3582470 , 071- 4083707

එච් . කේ . අජිත් පුෂ්ප කුමාර
ලියාපදිංචි මිනින්දෝරු සහ උසාවි කොමසාරිස්
අංක 63 / 9A , ශ්‍රී රතනපාල මාවත , මාතර .
ලි . ප . අ . 19861172
දුක 077- 3582470 , 071- 4083707

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව
### කපුකොරටුව පාර

## පිඹුරු අංකය : 1 5 5 7
පරිමාණය . 1 : 1 0 0 0

ගම : බතීගම මධ්‍යම
ග්‍රා . නි . කොට්ඨාශය : බතීගම නැගෙනහිර
ප්‍රා . ලේ . කොට්ඨාශය : දික්වැල්ල
ප්‍රා . සභාව : දික්වැල්ල
දිස්ත්‍රික්කය : මාතර
පළාත : දකුණු




යොමුව
ඉ : ඉවුර
ලී : ලී කනුව
වි.ක : විදුලි කණුව
පාවැ : පාලුගේ වැට
සික : සිමෙන්ති කණුව
දුක : දුරකතන කණුව

| මායිම් පෙන්වා දුන්නේ / මායිම් බලා ගත්තේ | චානිකා එදිරිවීර මිය , සංවර්ධන නිලධාරිනී , දික්වැල්ල ප්‍රාදේශීය සභාව. |
|---|---|

| කැබලි අංකය | බිම් ප්‍රමාණය අ. | රූ. | පර්. | හෙක්ටයාර් | මාර්ගයේ විස්තරය නම | ආරම්භය | අවසානය | වම් පස මායිම් | දකුණු පස මායිම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| A | 0 | 0 | 13.91 | 0.0352 | කපුකොරටුව පාර | ශ්‍රී චුල්ල පදුම නාහිමි මාවත | රංජිත් වත්තුහේවා මහතාගේ ඉඩම | වත්තුහේවාගේ මේරිනෝනා, සුගත් වත්තුහේවා සහ නුවන් ප්‍රියංකර වත්තුහේවා යන මහත්ම මහත්මීන්ගේ ඉඩම් | ඉන්ද්‍රානි වත්තුහේවා, සංජු ඉෂාන්, සුසන්ත ජයසුන්දර, මහදුරගේ අමිලා සහ එන්. හර්ෂිකා යන මහත්ම මහත්මීන්ගේ ඉඩම් |

මැනීම කළේ 201 7. 12 . 19 දින දීය

(අත්සන)
2018 . 01 . 10

එච් . කේ . අජිත් පුෂ්ප කුමාර
ලියාපදිංචි මිනින්දෝරු සහ උසාවි කොමසාරිස්
අංක 63 / 9A , ශ්‍රී රතනපාල මාවත , මාතර .
ලි . ප . අ . 19861172
දු . ක . 077- 3582470 , 071- 4083707

එච් . කේ . අජිත් පුෂ්ප කුමාර
බලයාපදිංචි මිනින්දෝරු සහ උසාවි කොමසාරිස්
අංක 63 / 9A , ශ්‍රී රතනපාල මාවත , මාතර .
ලි . ප . අ . 19861172
දුක 077- 3582470 , 071- 4083707


# පිඹුරු අංකය : 1 5 5 6

පරිමාණය . 1 : 1 0 0 0

## දික්වැල්ල ප්‍රාදේශිය සභාව

## සුහද මාවත

ගම : වේහැල්ල
ග්‍රා . නි . කොට්ඨාශය : වේහැල්ල ,
කොට්ඨාශ අංක 455
ප්‍රා . ලේ . කොට්ඨාශය : දික්වැල්ල
ප්‍රා . සභාව : දික්වැල්ල
දිස්ත්‍රික්කය : මාතර
පළාත : දකුණු




යොමුව
ඉ : ඉවුර
ලී : ලී කණුව
වික : විදුලි කණුව
පැව: : පැලෑටි වැට
සික : සිමෙන්ති කණුව
දුක : දුරකතන කණුව

| | |
|---|---|
| මායිම් පෙන්වා දුන්නේ<br>මායිම් බලා ගත්තේ | චාතිකා එදිරිවීර මිය ,<br>සංවර්ධන නිලධාරිනී ,<br>දික්වැල්ල ප්‍රාදේශිය සභාව. |

| කැබලි අංකය | බි මි ප්‍ර මා ණ ය | | | | මා ර ග යේ වි ස් ත ර ය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අ . | රූ . | පර් . | හෙක්ටයාර් | නම | ආරම්භය | අවසානය | වම් පස මායිම් | දකුණු පස මායිම් |
| A | 0 | 0 | 15.69 | 0.0397 | සුහද මාවත | වේළුවනාරාම මාවත | දේවසිරි නාරායන ලලිත් ස්වර්ණ ශාන්ත මහතාගේ ඉඩම | දොරේපාරේ බඩල්ලගේ විජේසිරි,සහ මහින්ද ලංකේශ්වර (පිගරැල්ලගෙවත්ත) යන මහත්වරුන්ගේ ඉඩම් | එස්.එල්.ඒ. අතුල රත්න(පහළවත්ත), ජේ. පී.ශාන්ති, මහින්ද ලංකේශ්වර සහ දොරේපාරේ බඩල්ලගේ අනුරාග යන මහත්ම මහත්මින්ගේ ඉඩම් |

මැනීම කළේ 2017 . 12 . 19 දින දිය

2018 . 01 . 10

එච් . කේ . අජිත් පුෂ්ප කුමාර
බලයාපදිංචි මිනින්දෝරු සහ උසාවි කොමසාරිස්
අංක 63 / 9A , ශ්‍රී රතනපාල මාවත , මාතර .
ලි . ප . අ . 19861172
දු . ක . 077- 3582470 , 071- 4083707

## හලාවත ප්‍රාදේශීය සභාව

### ග්‍රාමීය මාර්ග නම් කිරීම සම්බන්ධව කරනු ලබන දැන්වීම

හලාවත ප්‍රාදේශීය සභාවේ 2017.08.31 දින මෙහෙයුම් කමිටුවේ අනුමත වී ඇති පහත සඳහන් මාර්ගය යෝජිත නමින් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව විරෝධතා ඉදිරිපත් වී නොමැති අතර 1975 අංක 04 දරන වීථි නම් කිරීම ස්මාරක පිහිටුවීම හා පාලනය කිරීමේ පනතේ 6 වැනි වගන්තිය හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය 9-03 වගන්තිය සමග කියවෙන 198 වගන්ති ප්‍රකාරව 2017.12.02 දිනැති ලිපිය මගින් ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති පහත උපලේඛනයේ සඳහන් මාර්ගය සඳහා යෝජිත "හෝලි රෝසරි මාවත" නම භාවිත කරනු ලබන පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

01. හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඔලිදළුව ග්‍රාම නිලධාරි වසමේ බණ්ඩාරවත්ත මංසන්ධියේ සිට බස්නාහිර දෙසට වැටී ඇති ද ෆිනැන්ස් වත්ත මැදින් යන කොන්ක්‍රීට් යොදා ඇති මාර්ගය - "හෝලි රෝසරි මාවත"

| *අනු අංකය* | *නම් කරන ලද මාර්ගය* | *යෝජිත නාමය* |
|---|---|---|
| 01. | හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශයේ ඔලිදළුව ග්‍රාම නිලධාරි වසමේ බණ්ඩාරවත්ත මංසන්ධියේ සිට බස්නාහිර දෙසට වැටී ඇති ද ෆිනැන්ස් වත්ත මැදින් යන කොන්ක්‍රීට් යොදා ඇති මාර්ගය | "හෝලි රෝසරි මාවත" |

ආර්. ජේ. ඒ. එස්. හේමලතා,
ලේකම්,
හලාවත ප්‍රාදේශීය සභාව.

06-167/1

---

## හලාවත ප්‍රාදේශීය සභාව

### ග්‍රාමීය මාර්ග නම් කිරීම සම්බන්ධව කරනු ලබන දැන්වීම

හලාවත ප්‍රාදේශීය සභාවේ 2017.08.31 දින මෙහෙයුම් කමිටුවේ අනුමත වී ඇති පහත සඳහන් මාර්ගය යෝජිත නමින් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව විරෝධතා ඉදිරිපත් වී නොමැති අතර 1975 අංක 04 දරන වීථි නම් කිරීම ස්මාරක පිහිටුවීම හා පාලනය කිරීමේ පනතේ 6 වන වගන්තිය හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය 9-03 වගන්තිය සමග කියවෙන 198 වගන්ති ප්‍රකාරව 2017.10.29 දිනැති ලිපිය මගින් ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති පහත උපලේඛනයේ සඳහන් මාර්ගය සඳහා යෝජිත "ජුබිලි මාවත" නම භාවිත කරනු ලබන පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත්කරමි.

01. අංක 503 ඔලිදළුව ග්‍රාම නිලධාරි වසමේ බණ්ඩාරවත්ත ශුද්ධ වූ ජපමාල දේවමාතාවගේ දේවස්ථානය ඉදිරිපිට ඔලිදළුව ග්‍රාමයට යන දිග මීටර් 950 ක් හා පළල අඩි 18 ක් වන මාර්ගය - "ජුබිලි මාවත"

| *අනු අංකය* | *නම් කරන ලද මාර්ගය* | *යෝජිත නාමය* |
|---|---|---|
| 01. | අංක 503 ඔලිදළුව ග්‍රාම නිලධාරි වසමේ බණ්ඩාරවත්ත ශුද්ධ වූ ජපමාල දේවමාතාවගේ දේවස්ථානය ඉදිරිපිට ඔලිදළුව ග්‍රාමයට යන දිග මීටර් 950 ක් පළල අඩි 18 ක් වන මාර්ගය | "ජුබිලි මාවත" |

ආර්. ජේ. ඒ. එස්. හේමලතා,
ලේකම්,
හලාවත ප්‍රාදේශීය සභාව.

06-167/2

## හලාවත ප්‍රාදේශීය සභාව

### ග්‍රාමීය මාර්ග නම් කිරීම සම්බන්ධව කරනු ලබන දැන්වීම

හලාවත ප්‍රාදේශීය සභාවේ 2017.08.31 දින මෙහෙයුම් කමිටුවේ අනුමත වී ඇති පහත සඳහන් මාර්ගය යෝජිත නමින් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව විරෝධතා ඉදිරිපත් වී නොමැති අතර 1975 අංක 04 දරන වීථි නම් කිරීම ස්මාරක පිහිටුවීම හා පාලනය කිරීමේ පනතේ 6 වන වගන්තිය හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය 9-03 වගන්තිය සමග කියවෙන 198 වගන්ති ප්‍රකාරව 2018.02.26 දිනැති ලිපිය මගින් ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති පහත උපලේඛනයේ සඳහන් මාර්ගය සඳහා යෝජිත "කුවින්ටස් පියනම මාවත" නම භාවිත කරනු ලබන පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත්කරමි.

01. හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රට මැද මාර්ගයේ රත්නගිරිය පල්ලිය අසලින් ආරම්භ වී රත්නගිරිය වත්ත දක්වා දිවෙන දිග මීටර් 350 ක් පළල අඩි 09 ක් වන මාර්ගය - "කුවින්ටස් පියනම මාවත".

| *අනු. අංකය* | *නම් කරන ලද මාර්ගය* | *යෝජිත නාමය* |
|---|---|---|
| 01. | හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රට මැද මාර්ගයේ රත්නගිරිය පල්ලිය අසලින් ආරම්භ වී රත්නගිරිය වත්ත දක්වා දිවෙන දිග මීටර් 350 ක් පළල අඩි 09 ක් වන මාර්ගය | "කුවින්ටස් පියනම මාවත" |

ආර්. ජේ. ඒ. එස්. හේමලතා,
ලේකම්,
හලාවත ප්‍රාදේශීය සභාව.

06-167/3

---

## හලාවත ප්‍රාදේශීය සභාව

### ග්‍රාමීය මාර්ග නම් කිරීම සම්බන්ධව කරනු ලබන දැන්වීම

හලාවත ප්‍රාදේශීය සභාවේ 2017.05.23 දින මෙහෙයුම් කමිටුවේ අනුමත වී ඇති පහත සඳහන් මාර්ගය යෝජිත නමින් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව විරෝධතා ඉදිරිපත් වී නොමැති අතර 1975 අංක 04 දරන වීථි නම් කිරීම හා ස්මාරක පිහිටුවීම හා පාලනය කිරීමේ පනතේ 6 වන වගන්තිය හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය 9-03 වගන්තිය සමග කියවෙන 198 වගන්ති ප්‍රකාරව 2017.07.29 දිනැති ලිපිය මගින් ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති පහත උපලේඛනයේ සඳහන් මාර්ගය සඳහා යෝජිත "රාජසිංහ මාවත" නම භාවිත කරනු ලබන පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත්කරමි.

01. මැදගම ග්‍රාම නිලධාරී වසමට අයත් පනිරෙන්ඩාව මැදගම ඉන්ධන පිරවුම් හල ඉදිරිපසින් ආරම්භ වී හීන් අගාරග්‍රාමය දක්වා දිවෙන කිලෝමීටර් 1.47 සහ පළල මීටර් 06 ක් වන මාර්ගය - "රාජසිංහ මාවත".

| *අනු. අංකය* | *නම් කරන ලද මාර්ගය* | *යෝජිත නාමය* |
|---|---|---|
| 01. | මැදගම ග්‍රාම නිලධාරී වසමට අයත් පනිරෙන්ඩාව මැදගම ඉන්ධන පිරවුම් හල ඉදිරිපසින් ආරම්භ වී හීන් අගාර ග්‍රාමය දක්වා දිවෙන කිලෝමීටර් 1.47 සහ පළල මීටර් 06 ක් වන මාර්ගය | "රාජසිංහ මාවත" |

ආර්. ජේ. ඒ. එස්. හේමලතා,
ලේකම්,
හලාවත ප්‍රාදේශීය සභාව.

06-167/4

## හලාවත ප්‍රාදේශීය සභාව

### ග්‍රාමීය මාර්ග නම් කිරීම සම්බන්ධව කරනු ලබන දැන්වීම

හලාවත ප්‍රාදේශීය සභාවේ 2017.05.23 දින මෙහෙයුම් කමිටුවේ අනුමත වී ඇති පහත සඳහන් මාර්ගය යෝජිත නමින් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව විරෝධතා ඉදිරිපත් වී නොමැති අතර 1975 අංක 04 දරන වීථි නම් කිරීම ස්මාරක පිහිටුවීම හා පාලනය කිරීමේ පනතේ 6 වන වගන්තිය හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය 9-03 වගන්තිය සමග කියවෙන 198 වගන්ති ප්‍රකාරව 2017.10.26 දිනැති ලිපිය මගින් ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති පහත උපලේඛනයේ සඳහන් මාර්ගය සඳහා යෝජිත "ශුද්ධ වූ ජුසේවාස් මාවත" නම භාවිත කරනු ලබන පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත්කරමි.

01. හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඹකඳවිල විදුලි ට්‍රාන්ස්පෝමරය අසල ඉදි කරන ලද ශුද්ධ වූ ජුසේවාස් මුනිඳුන්ගේ ප්‍රතිමාවට යාබද දිග මීය්ර් 200 ක් හා පළලල අඩි 18 ක් වන මාර්ගය - "ශුද්ධ වූ ජුසේවාස් මාවත"

| අනු. අංකය | නම් කරන ලද මාර්ගය | යෝජිත නාමය |
|---|---|---|
| 01. | හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඹකඳවිල විදුලි ට්‍රාන්ස්පෝමරය අසල ඉදි කරන ලද ශුද්ධ වූ ජුසේවාස් මුනිඳුන්ගේ ප්‍රතිමාවට යාබද දිග මීටර් 200 ක් හා පළල අඩි 18 ක් වන මාර්ගය | "ශුද්ධ වූ ජුසේවාස් මාවත" |

ආර්. ජේ. ඒ. එස්. හේමලතා,
ලේකම්,
හලාවත ප්‍රාදේශීය සභාව.

06-167/5

---

## හලාවත ප්‍රාදේශීය සභාව

### ග්‍රාමීය මාර්ග නම් කිරීම සම්බන්ධව කරනු ලබන දැන්වීම

හලාවත ප්‍රාදේශීය සභාවේ 2017.10.30 දින මෙහෙයුම් කමිටුවේ අනුමත වී ඇති පහත සඳහන් මාර්ගය යෝජිත නමින් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව විරෝධතා ඉදිරිපත් වී නොමැති අතර 1975 අංක 04 දරන වීථි නම් කිරීම ස්මාරක පිහිටුවීම හා පාලනය කිරීමේ පනතේ 6 වන වගන්තිය හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය 9-03 වගන්තිය සමග කියවෙන 198 වගන්ති ප්‍රකාරව 2018.04.11 දිනැති ලිපිය මගින් ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති පහත උපලේඛනයේ සඳහන් මාර්ගය සඳහා යෝජිත "සුදුවැල්ල වත්ත මාර්ගය" නම භාවිත කරනු ලබන පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත්කරමි.

01. හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඌරලියාගාර ග්‍රාම නිලධාරී වසමේ කුලියාපිටිය පාර සුදුවැල්ල ප්‍රදේශයෙහි ඇති දිග මීටර් 800 ක් සහ පළල මීටර් 06 ක් වන මාර්ගය "සුදුවැල්ල වත්ත මාර්ගය".

| අනු. අංකය | නම් කරන ලද මාර්ගය | යෝජිත නාමය |
|---|---|---|
| 01. | හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඌරලියාගාර ග්‍රාම නිලධාරී වසමේ සුදුවැල්ල ප්‍රදේශයෙහි ඇති දිග මීටර් 800 ක් සහ පළල මීටර් 06 ක් වන මාර්ගය | "සුදුවැල්ල වත්ත මාර්ගය" |

ආර්. ජේ. ඒ. එස්. හේමලතා,
ලේකම්,
හලාවත ප්‍රාදේශීය සභාව.

06-167/6

## හලාවත ප්‍රාදේශීය සභාව

### ග්‍රාමීය මාර්ග නම් කිරීම සම්බන්ධව කරනු ලබන දැන්වීම

හලාවත ප්‍රාදේශීය සභාවේ 2017.12.08 දින මෙහෙයුම් කමිටුවේ අනුමත වී ඇති පහත සඳහන් මාර්ගය යෝජිත නමින් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව විරෝධතා ඉදිරිපත් වී නොමැති අතර 1975 අංක 04 දරන වීථි නම් කිරීම ස්මාරක පිහිටුවීම හා පාලනය කිරීමේ පනතේ 6 වැනි වගන්තිය හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය 9-03 වගන්තිය සමග කියවෙන 198 වගන්ති ප්‍රාකරව 2018.01.19 දිනැති ලිපිය මගින් ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති පහත උපලේඛනයේ සඳහන් මාර්ගය සඳහා යෝජිත "යූ. කේ. ඩී. ඇල්බින් ගුණතිලක මාවත" නම භාවිත කරනු ලබන පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත්කරමි.

01. ඌරලියාගාර ග්‍රාම නිළධාරි වසමේ මාදම්පේ නව නගරයේ මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිට දිග මීටර් 600 ක් සහ පළල මීටර් 06 ක් වන මාර්ගය - "යූ. කේ. ඩී. ඇල්බින් ගුණතිලක මාවත"

| අනු අංකය | නම් කරන ලද මාර්ගය | යෝජිත නාමය |
|---|---|---|
| 01. | ඌරලියාගාර ග්‍රාම නිළධාරි වසමේ මාදම්පේ නව නගරයේ මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිට දිග මීටර් 600 ක් සහ පළල මීටර් 06 ක් වන මාර්ගය | " යූ. කේ. ඩී. ඇල්බින් ගුණතිලක මාවත" |

ආර්. ජේ. ඒ. එස්. හේමලතා,
ලේකම්,
හලාවත ප්‍රාදේශීය සභාව.

06-167/7

---

## මහරගම නගර සභාව

### නගර සභා ආඥපනත යටතේ (255 වන අධිකාරිය) 50 හා 52 වන වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥපනතේ 255 වන අධිකාරියේ 50 සහ 52 වන වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම ප්‍රා-දේශීය ලේකම් කොට්ඨාසයේ මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට පරිපාලන කමිටුව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදළ දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටිරාජ් ලක්රුවන් පියරත්න,
සභාපති,
මහරගම නගර සභාව.

2018 මැයි මස 18 වැනි දින.

උපලේඛනය

| *අනු. අංකය* | *සැලසුම් අංකය, දිනය හා මිනින්දෝරු මහතාගේ නම* | *මාර්ගයේ නම* | *ග්‍රාම සේවා වසම* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* | *මාර්ගයේ ආරම්භය* | *මාර්ගයේ අවසානය* |
|---|---|---|---|---|---|---|---|
| 01 | සැ.අ : 127 ඒ. පී. දූරනියගල මිනින්දෝරු මහතා විසින් 1984.12.23 වැනි දින අඳින ලදී. | දඹහේන පාර වරිපනම් අංක 86/1 ඒ අසලින් ඇති අතුරු මාර්ගය | 528/ඒ දඹහේන | අඩි 180 | අඩි 20 අඩි 17.6 අඩි 15 | ව. අ. 86/1 ඒ | ව. අ. 84/1 |
| 02 | සැ.අ : 482 1999.11.17 වැනි දින ඒ. එස්. සී. විතානගේ මිනින්දෝරු මහතා විසින් අඳින ලදී. | තලවතුගොඩ ප්‍රයිම් පාර්ක් අතුරු මාර්ගය | මාදිවෙල | අඩි 283 | අඩි 15 | ව. අ. 339 | ව. අ. 339/3 |

06 - 307

---

## විවිධ දැන්වීම්

### සංශෝධනයයි

### දඹුල්ල මහ නගර සභාව

2017.12.22 දින පළ කරන ලද අංක 2051 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ 12-743/1 නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

| කාරණය | පළ වී ඇති ගණන | නිවැරදි විය යුතු ගණන |
|---|---|---|
| ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු යටතේ | | |
| 1. කර්මාන්ත ගිවිසුම් පත් ගාස්තුව | රු. 35 000.00 | රු. 350.00 |
| 2. නගර සභා මාර්ගයන්හි බොරළු ප්‍රවාහනය කිරීම සඳහා කියුබ් 01 කට | රු. 5000.00 | රු. 50.00 |
| 3. බොරලු ඇතිරූ මාර්ග උරහිස් දිගේ පළුදු කිරීම සඳහා වර්ග අඩි 01 ක් සඳහා | රු. 5500.00 | රු. 55.00 |

ආර්. එම්. කේ. ආර්. බී. රත්නායක,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
දඹුල්ල.

06-306

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.